

# සන්න සහිත
# රාමක්ඛඳ සංදේශය



සන්නසහිත

# රාමඤ්ඤ සන්දෙසය

දෙඩන්දුවේ ශෛලබිම්බාරාමයෙහි නිවාසි

ආචාය්‍ය්‍ය ශීලක්ඛන්ධ ස්ථවිර පාදයන් වහන්සේගෙ

ශිෂ්‍ය වූ

ගින්තොට ජයවර්ධනාරාමයෙහි නිවාසි

මෙධඞ්කර සාමින් නාන්සේ විසින්

සංශොධිතයි.

THE

# RAMANNA SANDESA.

WITH THE SINHALESE TRANSLATION

EDITED BY

G. MEDHANKARA PRIEST

AMBALAMGODA

PRINTED BY, A. W. GUNAWARDHANA

AT THE VIDYAPRAKASA PRESS.

1893.

# විඥාපනය.

## රාමඤ්ඤ සන්දේසය.

මෙනම් ප්‍රකරණය කවරකලකවිසූ කිනම් පඬිවරයකු විසින් රචනාකරණ ලද දැයි අපට දැනගන්ට නොලැබුනේයි, එසේනුමුත් මිට හවුරුදු හයසියකටපමණ පූර්වයෙහි රචනාකරණ ලද්දක්බවට අනුමානකටයුතු කරුණුපෙණේ, මේ පොත රචනාකළ පඬිවරයා කවුරුනුමුත් ව්‍යාකරණ ඡන්දොලඞ්කාරාදි ශාස්ත්‍රවිෂයෙහි පටුතර බුඞිමත් මහ පඬිවරයෙකුබව හැඟෙයි, මෙයපද්‍යසඞ්ඛ්‍යාවෙන් බහුල නුවූයේද කාව්‍යයකට ප්‍රධානවූ වාග්විදග්ධතාගුණයෙන් පරිපූර්ණව තිබේ, එබැවින් පොතකුඩානුමුත් මාගධපද්‍යරචනාවෙහි නිසැලිවූ ආධුනිකයන්ට මෙයින් ලැබියහැකි ඵලය කුඩානොවේ.

එසේදවුවත් මෙය කාලන්තරයෙන් හටගත් ලිපිකර දෝෂයෙන් මෙපමණකල් අතිශයින් ව්‍යාකූලවතුබුනේය, මේ පොත මෙපමණ කල් හලුයෙන්වැසුනු ගිනිහඟුරක්සේ පැවැත්තේයයි කියන්ටවටී, මිට ව්‍යවහාරකරණලද **රාමඤ්ඤසන්දේසය** යන නාමයද පොතේ නියම නමක්නොවෙයි, රාමණ්‍යරටින් ලක්දිවට එවන ලද්දැයි බොහෝදෙනාගේ කල්පනාවබැවින් මෙසේ ව්‍යවහාරවියයි සිතිය හැකියි.

මේ ප්‍රකරණය පද්‍ය 59 කින්යුක්තයි, එහිමුලපටන් දසවෙනි ගාථාව දක්වා ලක්දිව මහානාගකුලනම් නුවරසමීපයෙහි කරණ ලද විහාරයක් වර්ණනාකිරීමයි, 11 වෙනිගාථාවේ පටන් 22 වෙනි ගාථාවදක්වා එමවිහාරයෙහිවිසූ නාගසේනනම් මහතෙරකෙනෙකුන්ගේ වර්ණනායි. 23 වන්නේපටන් 34 වන්නදක්වා දඹදිව අරිමර්දනදෙශයෙහි රාජධානියක් වර්ණනාකිරීමයි. 35 වන්නේපටන් 39 වන්නදක්වා ඒ අරිමර්දන දෙශාධිපති මහරජතුමාගේ වර්ණනායි. 40 වන්නෙන් ඒ රජතුමාවිසින් විහාරයක් කරවනලදබවද එතැන්පටන් 45 වන්නදක්වා එමවිහාරයෙහි අලඞ්කාරද එතැන් පටන් 49 වන්නදක්වා එමවිහාරයෙහි වැඩසිටි සඞ්ඝරක්ඛිත මහ තෙරකෙනෙකුන්ගේ ගුණවර්ණනාද කරණලදී. 50 වන්නේපටන් කස්සපමහහිමියන්ගේ හා නාගසෙනමහතෙරුන්ගේ නාමකීර්තනය ආශිර්වාද පෙරදැරිව ඒ කස්සපමහහිමියන්ගේ ගුණවර්ණනා හා සාමග්‍රි පරිදීපක ගාථා කීපයක්ද දක්වා පොත සමාප්තකරතිබේ.

මෙහි අග ගාථාදෙකකට ව්‍යාඛ්‍යානද අපට ලැබුනු සෑමපොත්වලම අඩුවටමපෙණේ.

*G. Medhankara.*

## ශොධ්‍යපත්‍රය.

| පිටේ. | පෙලේ. | අශුඬ. | ශුඬ |
|---|---|---|---|
| 2 | 7 | ශිලසමාධ්‍යාදි | ශීලසමාධ්‍යාදී |
| | 30 | අඳොලිත, | ආඳොලිත, |
| 4 | 22 | වෙුන්ගෙ, | මොවුන්ගෙ, |
| | 34 | නාදදපවත්වත්නාවූ, | නාදපවත්වන්නාවූ, |
| | 35 | උද්වේග, | උද්වෙග, |
| 5 | 4 | මුපයනානි, | මුපයනාති, |
| | 11 | උපයනානි, | උපයනාති, |
| 6 | 4 | තුසාරරශ්මීනු, | තුෂාරරශ්මීනු, |
| 7 | 8 | සුරපගාවිහරණො, | සුරාපගාවිහරණො |
| 8 | 4 | නිම්මමො | නිම්මමො |
| | 22 | වීජ්ජාපගා, | විජ්ජාපගා, |
| 13 | 14 | ගේකොදයත්; | ගේකොසේදයත්, |

නමො තස්ස
භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1 රම්මා මහානාගකුලොදිතම්හා
පුරා මහානාගකුලාකුලම්හා,
උදිච්චසම්පන්නකුලාචිතම්හා
සමිද්ධිසංයොගවිභූසිතම්හා.

රම්මා, සිත්කලුවූ; මහා, මහත්වූ; නාග, හස්තීන්ගේ; කුල, සමූහයෙන්; ආකුලම්හා, ගැවසිගත්තාවූ; උදිච්ච, උසස්වූ නොහොත් උතුම්වූ; සම්පන්න, සමෘද්ධවූ; කුල, වංශයේ; ආචිතම්හා, රැස්කරණලද්දාවූ; සමිද්ධි, සමෘද්ධීන්ගේ; සංයොග, යෙදීමෙන්; විභූසිතම්හා, සරසනලද්දාවූ; මහානාගකුල, මහානාගකුල යන නමින්; උදිතම්හා, ප්‍රසිද්ධවූ; පුරා, නුවරින්.

2 ලක්ඛිත්ථි වදනෙ විභූති සදනෙ සාතච්ච සම්මානනෙ
යස්මිං සජ්ජිත තොරණෙ සතරුණෙ සාධූන සාධාරණෙ,
ධම්මාරාම කුලෙ විලොප විකලෙ පච්චත්ථි දුග්ගාචලෙ
ආරාමො අහු රාමණෙය්‍ය විභවො දබ්බසාරො වරො.

ලක්ඛා, ලක්ඛානැමැති; ඉත්ථි, කාන්තාවගෙ; වදනෙ, වක්ත්‍රයක්බඳුවූ; විභූතිසදනෙ, සම්පත්තීන්ට ගෘහයක්බඳුවූ; සාතච්ච, අනවරතයෙන් පවත්නාවූ; සම්මානනෙ, පූජා සත්කාරඇති; සජ්ජිත, සරහනලද; තොරණෙ, තොරන්ඇති; සතරුණෙ, ළදරුවන් සහිතවූ; සාධූනං, සත්පුරුෂයන්ට; සාධාරණෙ, සමානවූ; ධම්ම, ධර්මයෙහි; ආරාම, ඇලුම්වූ; කුලෙ, කුලයන්ඇති; විලොප, පැහැර ගැන්මෙන්; විකලෙ, විකලවූ හෙවත් පෙළාගැන්මක් නැත්තාවූ; පච්චත්ථි, පසමිතුරන්විසින්; දුග්ග, යානොහැක්කාවූ; අචලෙ, පර්වතඇති; යස්මිං, යම්පුරයෙක්හි; රාමණෙය්‍ය, සිත්කලුවූ; විභවො, (උද්‍යාන විමානාදීන්ගෙ) සමෘද්ධිඇති; දබ්බසාරො, දැකුම්කටයුතු වස්තූන්ගෙ සාරඇති; වරො, උතුම්වූ; ආරාමො, විහාරයෙක්; අහු, වි.

3 යස්මිංවිහාරෙ යතිපුඞ්ගවානං ගුණාතිභාරුබ්බහනාතුරෙව,
මහී සමුන්නාමිත තොරණොඝ බාහාහි වාරොචයතෙ විසාදං.

යස්මිංවිහාරෙ, යම්විහාරයෙක්හි; යතිපුඞ්ගවානං, තපස්විශ්‍රෙෂ්ඨයන්ගෙ; ගුණ, ගුණයන්ගෙ; අතිභාර, අධිකභාරය; උබ්බහන, ඉසිලීමෙන්; ආතුරාඉව, පෙළෙන ලද්දියකමෙන්; මහී, පෘථිවිතොමෝ; සමුන්නාමිත, නංවනලද; තොරණ, තොරණයන්ගෙ; ඔඝ, සමූහ නැමැති; බාහාහි, හස්තවලින්; විසාදං, ආයාසය; ආරොචයතෙ, (ඉව) ප්‍රකාශකරණලද්දියක මෙන්; (වූද.)

4 සුද්ධදුද්ධ පටලංව වාලුකා
පට්ටමට්ට හසිතංව භූමියා,
භාති යත්‍ථ මුනිවීර නීරජ
පුප්ඵථොරු ගුණ රේණුසන්නිභං.

සුද්ධ, පිරිසිදුවූ; දුද්ධපටලං ඉව, ක්ෂීරපටලයක් වැනිවූ; මුනිවීර, වීර්‍ය්‍යඇති තපස්වීන්ගැමැති; නීරජ, පද්මයන්ගෙ; පුප්ඵ, පතළාවූ; උරු, මහත්වූ; ගුණ, (ශීලසමාධ්‍යාදි) ගුණනැමැති; රේණු සන්නිභං, රොන්සළාවක්හා සාදෘශ්‍යවූ; වාලුකාපට්ටං, වැලිතලාව; භූමියා, පෘථිවියගෙ; අට්ටහසිතංඉව, මහත්වූසිනහවක්මෙන්; යත්‍ථ, යම්විහාර යෙක්හි; භාති, බබලන්නේද.

(යත්‍ථ යම්විහාර යෙක්හි)

5 අම්බරෙ අවලම්බන්තා ධරාසන්නිහිතා ථිරා,
පාසාදා භිවිරොචන්ති සාරදාව පයොධරා.

පාසාදා, ප්‍රාසාදයෝ; අම්බරෙ, ආකාශයෙහි; අවලම්බන්තා, එල්ලෙන්නාවූ; ධරාසන්නිහිතා, පෘථිවියෙහි පිහිටියාවූ; ථිරා, ස්ථිරවූ; සාරදාවපයොධරා, සරත්කාලයෙහි ඇති ජලධරයන්මෙන්; අභිවිරොචන්ති, බබලද්ද.

6 දීපා ඣායන්ති ආරාමෙ සද්ධිං සම්බුද්ධ සූනුහි,
අන්ධකාරා විගච්ඡන්ති සද්ධිං චිත්තමලෙහිපි.

(යත්‍ථ) ආරාමෙ, (යම්) විහාරයෙක්හි; සම්බුද්ධසූනුහිසද්ධිං, බුද්ධපුත්‍රයන්හා සමග; දීපා, ප්‍රදීපයෝ; ඣායන්ති, බබලන්නාහ; නොහොත් ධ්‍යානකරන්නාහ; චිත්තමලෙහි සද්ධිං, චිත්තමලයන්හා සමග; අන්ධකාරාපි, අන්ධකාරයෝද; විගච්ඡන්ති, පහවෙද්ද.

(යත්‍ථ යම්විහාර යෙක්හි)

7 ඉන්දින්දිරානන්දන මඤ්ජරීකා
මඤ්ජුනිලානෙලිත පල්ලවග්ගා,
සමුග්ගිරන්තීව ඝනානුරාග
මනොකහා සංයති සද්ධලද්ධං.

ඉන්දින්දිර, භෘඞ්ගයන්; ආනන්දන, සතුටුකරවන්නාවූ; මඤ්ජරීකා, මල්නැන්ඇති; මඤ්ජුනිල, මඳපවනින්; අනෙලිත, සලනලද; පල්ලව, කිසලයන්ගේ; අග්ගා, අග්‍රඇති; අනොකහා, වෘක්ෂයෝ; සංයති, උතුම්වූයතීන්හා; සද්ධ, එක්විමෙන්; ලද්ධං, ලබනලද; ඝන, සාන්ද්‍රවූ, අනුරාගං, ප්‍රෙමය; සමුග්ගිරන්තීව, වමාරන්නවුන් මෙන් වූද.

(යත්‍ථ සම්විහාර යෙක්හි)

8 මන්දමන්දපවනග්ග කම්පිතා
බාලසාල වලයා විහඞ්ගමෙ,
වාරයන්තිරිව තුඞ්ගකූජිතෙ
ඛිත්තනන්දන විබාධනෙහයා.

මන්දමන්දපවන, මඳමඳපවනින්; අග්ග, අග්‍රයෙහි; කම්පිතා, සලනලද; බාලසාලවලයා, වටඇති තරුණවෘක්‍ෂයෝ; ඛිත්තනන්දන, ධක නප්‍රිතිය; විබාධනෙහයා, වලකනාහයින්; තුඞ්ගකූජිතෙ, මහත්වූනාදඇති; විහඞ්ගමෙ, පක්ෂීන්; වාරයන්තිඉව, වලකන්නාවුන් මෙන්වූහුද.

9 අසාරභාවෙ කදලිවනාවලී
චිරස්සනින්දපරි පීලිතා යහිං,
විධාය ඣායා සම්පුඞ්ගවානුගා
සුභෙසිනි නූන තපොවනජ්ඣගා.

යහිං, යම්විහාරයෙක්හි; කදලිවනාවලී, කදලිවනපඞ්ක්තිතොමෝ; අසාරභාවෙ, සාරයක්නැතිබව නිමිත්තකොටගෙණ; චිරස්සං, බොහෝකාලයක්; නින්ද, නින්දයෙන්; පරිපීලිතා, පෙළෙනලද්දී; යම්පුඞ්ගවානුගා, තපස්විශ්‍රෙෂ්ඨයන් අනුවයන්නී; ඣායාවිධාය, ඣායාවන්කොට; සුභෙසිනී, වැඩසොයන්නී; තපොවනං, තපොවනයට; අජ්ඣගානූන, පැමිණියයි හඟිමි.

10 යස්මිං සම්මසනානුබද්ධ හදයෙ ආතාපිනො සංයත
නෙකෙ සංයමි පුඞ්ගවෙ ගුණගණා රාමෙපිරා රම්භිතෙ,
සෙවනෙත වනවාහිනී සුචිපයෝ රඞ්ග තරඞ්ගාකුලෙ
රඞ්ගන්තා මුදුමාරුතා කලරුතා සාකුන්ත සඞ්කූජිතා.

යස්මිං, යම්විහාරයෙක්හි; සම්මසන, විදර්ශනාභාවනායෙහි; අනුබද්ධ, අනුවබැඳුනාවූ; හදයෙ, සිත්ඇති; ආතාපිනො, කෙලශයන්තවන්නාවූ වීර්‍යඇති; සංයතෙ, සංසිඳුනාවූ; ගුණගණ, ගුණසමූහයෙහි; ආරාමෙ, ඇලුම්ඇති; පිරාරම්භිතෙ, ස්ථිරවූආරම්භඇති; අනෙකෙ, නොයෙක්; සංයමිපුඞ්ගවෙ, තපස්වි ශ්‍රෙෂ්ඨයන්; තරඞ්ගාකුලෙ, රළපතරින්ගැවසිගත්තාවූ; වනවාහිනී, වනනදියෙහි හෙවත් වලහොය; සුචි, පවිත්‍රවූ; පයොරඞ්ග, ජලනැමැති රඞ්ගමණ්ඩලයෙහි; රඞ්ගන්තා, නටන්නාවූ; කලරුතා, මධුරනාදඇති; සාකුන්ත, පක්ෂීන්විසින්; සඞ්කූජිතා, රැව්පිළි රැව්කරනලද; මුදු, මොලොක්වූ; මාරුතා, පවන්හු; සෙවනෙත, සෙවනය කෙරෙද්ද.

11 එවංවිධෙ චාරුතරෙ විහාරෙ
විසුද්ධ සද්ධම්මනිකෙතන රම්මෙ
රණද්ධජයාබද්ධ මනොරථොහු
ථෙරො [මහානාග චමූපත්තො.

එවංවිධෙ, මෙබඳුවූ; චාරුතරෙ, අතිශයින්සිත්කලුවූ; විසුද්ධ, පිරිසිදුවූ; සද්ධම්ම, සද්ධර්මයට; නිකෙතන, වාසස්ථානයක්බඳුවූ; රම්මෙ, රම්‍යවූ; විහාරෙ, විහාරයෙහි; රණද්ධජය, කෙලශයුද්ධයෙහි ජයගැන්මට; ආබද්ධ, තරකොට බඳනාලද; මනොරථො, සිත්ඇති; මහා, මහත්වූ; නාගචමූපතිනො, නාගසෙන යනනමින් ප්‍රසිද්ධවූ; ථෙරො, ස්ථවිර යෙක්; අහු, වීද.

12 නිස්සඞ්ගො දානධාරා සුරභිගුණගණා ධොරණා රොහණබද්ධො
සික්ඛා කාරුඤ්ඤපුඤ්ඤස්සවන විසරණා සූණිතා සාණුරෙණු,
යොහූ වාණීකරෙණු රණරණකමහා වාරණොදාරණාය
පඤ්ඤාතික්ඛොරුදනෙතා සමණමණිමහා ගන්ධමාතඞ්ගනාගො.

නිස්සඞ්ගො, රැඳීමක්නැත්තාවූ; නොහොත් ඇල්මක්නැත්තාවූ; දානධාරා; මදයන්ගෙප්‍රවාහයෙන්; සුරභි, සුගන්ධවූ; නොහොත් දානධාරා, ත්‍යාගප්‍රවාහයෙන්; සුරභි, ප්‍රසිද්ධවූ; ගුණගණ, රජ්ජුසමූහයෙන්ද; ආධොරණ, හස්ත්‍යාචාර්යයාගෙ; ආරොහණ, නැගීමෙන්ද; අබද්ධො, සම්බද්ධවූ; නොහොත් ගුණගණ, ශීලසමාධ්‍යාදි ගුණසමූහනැමැති; ආධොරණ, හස්ත්‍යාචාර්යයාගෙ; ආරොහණ, නැගීමෙන්; අබද්ධො, සම්බද්ධවූ; සික්ඛා, හික්මීමය; කාරුඤ්ඤ, මනාබවය; පුඤ්ඤ, පවිත්‍රතාය; අස්සවන, කීකරුබවයයනමොවුන්ගෙ; විසරණ, පැතිරීමෙන්; ආසූණිත, නංවනලද්දාවූ; අඞ, අඟසෙහි; අණුරෙණු, සූක්ෂම්වූ ධූලිඇති; නොහොත් සික්ඛා, ත්‍රිවිධශික්ෂාය; කාරුඤ්ඤ, කාරුණ්‍යවය; පුඤ්ඤ, අවශෙෂකුශලය; යන මොවුන්ගෙ; සවන, ප්‍රවාහයාගෙ; විසරණ, පැතිරීමෙන්; ආසූණිත, කම්පාකරණලද; අඞ, පාපනැමැති; අණුරෙණු, සූක්ෂම්වූ රෙණුඇති; වාණීකරෙණු, මධුරනාදයෙන් යුක්තවූ හස්තිධෙනූන්ඇති; නොහොත් සරස්වතීනැමැති හස්තිධෙනූන්ඇත්තාවූ; පඤ්ඤා, ප්‍රඥාහා; තික්ඛ, තියුණුවූ; උරුදනෙතා, මහත්දලඇති; නොහොත් පඤ්ඤාතික්ඛ, තීක්ෂණප්‍රඥානැමැති; උරුදනෙතා, මහත්දලඇති; සමණ, නාදසහිතවූ; මණි, මිණිඇති; නොහොත් සමණ, භික්ෂූන්නැමැති; මණි, මාණික්‍යඇත්තාවූ; යො ගන්ධමාතඞ්ගනාගො, යම් ගන්ධහස්තිශ්‍රෙෂ්ඨයෙක්තෙම්; රණ, සටනෙහි; රණක, නාද දපවත්වන්නාවූ; මහාවාරණ, මහත්වූ හස්තීන්ගෙ; නොහොත් රණරණක, උද්වේග නැමැති; මහාවාරණ, මහ ඇතුන්ගෙ; උදාරණය, පැලීම්පිණිස; අහු, වීද.

13 සඞ්ඛින්දු කුන්ද හරහාර මුනාලනාල
භාගිරථී සලිල නිම්මල කිත්තිපූරෙ,
යස්මිං වසන්තකුලිතෙ පවිජම්භමානෙ
සම්ඵුල්ල ලක්ඛි මුපයන්ති තපොවනානි.

සඞ්ඛ, ධෞතශඞ්ඛය; ඉන්දු, චන්ද්‍රයාය; කුන්ද, කොඳය; හර, ඊශ්වරයාය; හාර, මුක්තාහාරය; මුනාලනාල, නෙළුම්දළිය; භාගිරථී සලිල, ආකාශගඞ්ගාවෙහි ජලයමෙන්; නිම්මල, නිර්මලවූ; කිත්ති පූරෙ, යශසින්පිරුණාවූ; යස්මිං, යම්සථවිරයකු; වසන්තකුලිතෙ, වසන්තකාලයහාආකුලිතව; පවිජම්භමානෙ, විජෘම්භණයවනකල්හී; තපොවනානි, තපොවනයෝ, සම්ඵුල්ලලක්ඛිං, මොනවට පිපිශෝභාවට; උපයන්ති, පැමිණේදැ.

(යසසව යමක්හුගේ)

14 නටති සිරසිරෙණු බුඬපාද රවින්දෙ
නටති සුගතවාණී වාණිනී කණ්ඨරඞ්ග,
නටති හදයරඞ්ග භාවනා නාටකිත්ථී
නටති චරණරඞ්ග ලොකමොලීන මාලී.

සිරසි, මස්තකයෙහි; බුඬ, සර්වඥයන්වහන්සේගේ; පාද, චරණනැමැති; අරවින්දෙ, පදමයෙහි; රෙණු, ධූලි; නටති, නටන්නීද; කණ්ඨ, ගෙලනැමැති; රඞ්ග, රඞ්ගමණ්ඩලයෙහි, සුගත, සර්වඥයන්වහන්සේගේ; වාණී, වාක්නැමැති; වාණිනි, නාටකිතොමෝ, නටති' නටන්නීද; භාවනා, භාවනානැමැති; නාටකිත්ථී, නාටකස්ත්‍රීතොමෝ; හදය, හෘදයනැමැති; රඞ්ග, රඞ්ගමණ්ඩලෙහි; නටති, නටන්නීද; ලොක, ලොකවාසීන්ගේ; මොලීනං, මකුටයන්ගේ; ආලී, පෙළ, (හැඞගශ්‍රේණීන්මෙන්වී) චරණ, පාදනැමැති; රඞ්ග, රඞ්ගමණ්ඩලෙහි; නටති, නටන්නීද.

(යසසබලු යමක්හුගෙ වනාහි)

15 මුත්තාගුණත්තෙපි ගුණාමහග්ඝා
න දීඝසුත්තා න සරන්ධවුත්තා,
නිහාරභානු නපි සොමභාවෙ
න සූලපාණී න කපාලධාරී.

මහග්ඝා, මාහැඟිවූ; ගුණ, (ශීලසමාධ්‍යාදි)ගුණයෝ; මුත්තාගුණත්තෙපි, මුක්තාබවඇතිකල්හිද; නොහොත්;මුත්ත, හරණලද; අගුණත්තෙපි, නිර්ගුණබව ඇතිකල්හිද; නදීඝසුත්තා, දික්වූනූල්ඇත්

තාහු නොවෙද්ද; නොහොත් අප්‍රමාදයෙහි; චිරක්‍රියා නොවෙද්ද; සරන්ධ, ඡිද්‍රසහිතවූ නොහොත් සරන්ධ, දෙෂසහිතවූ; වුත්තානන, පැවතුන් ඇත්තාහු නොවෙද්ද; සොමභාවෙඅපි, චන්ද්‍රභාවඇතිකල්හිද; නොහොත් චන්ද්‍රසාටබද්ධ ශොභා ඇතිකල්හිද; නිහාරභානුන, තුසාරරශ්මිහු නොවෙද්ද; නසූලපාණි, ශූලායුධගත් අත්ඇත්තෝ නොවෙද්ද; නොහොත් පරපීඩාසහිතවූ අත්ඇත්තාහු නොවෙද්ද? නකපාලධාරී, සීසකපාල දරන්නාහු නොවෙද්ද; නොහොත් කපාලධ, භික්ෂාපාත්‍ර දරන්නාවුන්ට; අරින, සතුරෝ නොවෙද්ද.

16 ජනප්පසාද විය යස්සසාරා
සුධාභිසිත්තා විය චන්දගාවො,
සරොරුහාලීව සකෙසරාලී
ගුණානුරාගෙන ගුණාවිභූසිතා.

යස්ස, යමක්හුගේ; සාරා, උත්තමවූ; ගුණා, ගුණයෝතුමු; ජනප්පසාදවිය, ජනයන්ගේ ප්‍රසාදයන්මෙන්ද; සුධාභිසිත්තාවිය, අමෘතාභිෂෙක කරණලදුවුන්මෙන්ද; චන්දගාවො, චන්ද්‍රමරීචින්මෙන්ද; සකෙසරාලී, කෙශරභාරසහිතවූ; සරොරුහාලීඉව, පද්මෂණ්ඩයන්මෙන්ද; ගුණානුරාගෙන, ගුණානුරාගය හෙතුකොටගෙණ; විභූසිතා, හෙබියාහුද; හෙවත් සැරසුනාහුද.

17 න චන්දකන්තූපලවන්තනිජ්ඣරා
නචන්දපාද නච චන්දනද්දුවා,
නචාචහාරාභරණාන නියරෙ
සමන්තතො යස්ස යථා ගුණාවලී.

යස්ස, යමක්හුගේ; ගුණාවලී, ගුණශ්‍රෙණීහු; යථා, යම්සේ; සමන්තතො, හාත්පස්හි; හෙවත් මුලුල්ලෙහි; නියරෙ, පැමිණෙනුලැබෙද්ද; චන්දකන්තූපලවන්තනිජ්ඣරා, චන්ද්‍රකාන්ති මාණික්‍යොපලයෙන් වැහෙන්නාවූ නිජ්ඣරයෝද; (එසේම) ననියරෙ, නොපැමිණෙනුලැබෙති; නචන්දපාද, චන්දමරීචිහුද; (එසේනොපැමිණෙනුලැබෙති;) නචන්දනද්දුවා, චන්දනකල්කයෝද; (එසේනොපැමිණෙනුලැබෙති;) නචාචහාරාභරණා, අභිනවමුක්තාහාරාභරණයෝද; (එසේම) ననියරෙ, මුලුල්ලෙහි පැමිණෙන්නාහු නොවෙත්;

18 ලද්ධායා හරණො ගුණස්සරණොධම්මාකරෙතොරණො
කුම්මග්ගා වරණො විසුද්ධචරණො සොයං අසාධාරණො,
තණ්හාකුලවිදූරණො රණරණව්‍යාපාරණො දූරණො
ධම්මප්පීතිසුරාපගා විහරණෙ එරාවණො වාරණො.

ලඞ්කායාභරණො, ලඞ්කාවට ආභරණයක්වැනිවූ; ගුණොඝසරණො, ගුණසමූහයට වාසස්ථානවූ; ධම්මාකරෙතොරණො, ධර්මාකරයෙහිතොරණයක්වැනිවූ; කුම්මග්ගාවරණො, මිථ්‍යාදෘෂ්ටිමාර්ගයට අකුලක්වැනිවූ; විසුද්ධචරණො; නිර්මලසඞ්ඛ්‍යාචාරඇති; හෙවත් නිර්මලවූකායවාක්සමාචාරඇති; අසාධාරණො, එසින්මඅසදෘශවූ; තණ්හාකුලවිදූරණො, තෘෂ්ණානැමැති රොදය සිඳින්නාවූ; රණරණව්‍යාපාරණ්, කාමව්‍යාපාරය; හෙවත් කාමොත්සාහය; උදූරණො, නසන්නාවූ; ධම්මප්පීතිසුරපගාවිහරණෙ, ධර්මප්‍රීති නැමැති ආකාශගඞ්ගාජල ක්‍රීඩායෙහි; එරාවණෙෘවාරණො, ඓරාවණ හස්තිරාජයාවැනිවූ; සොඅං, ඒමේ; (මහානාගවමුපතිනො ථෙරො,) මහානාගසෙන යනනමින් ප්‍රසිද්ධවූ ස්ථවිරයෙක් වී.

19 තෙජොගණා චීවරලක්ඛණෙන
පරිස්සජන්තීව තනුං සමන්තා,
දූරාසදෙ යෙන යමිස්සරො සො
සසෙන මාරෙනපි දුද්දමෙන.

චීවරලක්ඛණෙන, චීවරව්‍යඤ්ජනයෙන්; තෙජොගණ, තෙජස්සමූහයෝ; තනුං, ශරීරය; සමන්තා, හාත්පසින්; පරිස්සජන්තීව, අනවශෙෂකළාහුයයි සිතමි; කුමක්හෙසින්දයත්? යෙන, යම්; දුද්දමෙන, දමනයකොටගත නොහැක්කාවූ; සසෙන, සෙනාසහිතවූ; මාරෙනපි, මාරයාවිසින්ද; සො යමිස්සරො, ඒමේ යතිශ්වරතෙම; දූරාසදෙ, පැමිණගත නොහැක්කේය, (එහෙසින).

20 ආසා යතො පටුතරං මුනිකොමුදනි
නීහාරභානු ලසිතෙන හිලාදයානො,
සො නාගසෙන යමිපො යසරංසිපුරො
ආසාවිසාල වලයං ධවලීකරොති.

ආසා, එළදික්හි; යතො, යම්හෙයකින්; පටුතරං, ව්‍යක්තකොට; හෙවත්ප්‍රබොධකොට; මුනිකොමුදනි, භික්ෂුනැමැතිකෞමුදයන්; නීහාරභානුලසිතෙන, චන්ද්‍රවිලාසයෙන්; හිලාදයානො, සතුටුකරවන්නාවූ; යසරංසිපුරො; යශඃශ්‍රිකාන්තිඇති; සොනාගසෙනයමිපො; ඒ නාගසෙනයතීන්ද්‍රතෙම; ආසාවිසාලවලයං, දික්චක්‍රවාලය; ධවලීකරොති, ධවලකරන්නේයි; හෙවත් ශුභ්‍රකරන්නේයි.

## අපිච, සලිඳු කියත්.

31 සනාගසෙනොපි හිලාදයෙ ජනං
ඝනානුරාගොපි පජාසු නිම්මමො
යමාභිරාමොපි දූරාසදෙ සදා
විරූළ්හමූලොපි ච අග්ගසම්මතො.

සාගමෙසන්තොපි, සාගමෙනසහිතවූයේද; නොහොත් ස්වකීයවූ
ආගමසෙනායත ගම්ඇත්තේද; ජනං, ජනයා; හ්ලාදයෙ, සතුටුකරන්
නේය; ජනානුරාගොපි, සාදුවූ අනුරාගඇත්තේද; පජාසු, සත්වයන්
කෙරෙහි; දෙහෝ නොහොත් පුත්‍රයන්කෙරෙහි; නිම්මමො, මමත්ව
යක්නැත්තේය; සමාභිරාමොපි, සංයමගුණයකින් මනොඥවූයේද;
සදා, හැමකල්හි; දුරාසදො, පැමිණිගත නොහැක්කේය; විරූළ්හමූ
ලොපිච, හටගත්තාවූ මුල්ඇත්තේද; නොහොත් ප්‍රසිඬඋත්පත්තිස්ථා
නඇත්තේද; අග්ගසම්මතො, අග්‍රයයිදන්නාලදී.

## කිංබහුනා, බොහෝකොට කීමෙන් ප්‍රයොජන කිම්ද?

22 පාණො සද්ධම්මිස්සරසාසනස්ස
නිබද්ධකවෙජ්ජා කලිසාසනස්ස,
නිකෙතභූතො තපසාසනස්ස
සිරිධරො සිස්සපසාධනස්ස.

සද්ධම්මිස්සරසාසනස්ස, ස්වකීයවූශාස්තෘශාසනයට; පාණො, ජීවි
තයක්වැනිවූ; කලිසාසනස්ස, පාපවිනාශයට; නිබද්ධකවෙජ්ජා, බඳනා
ලදකැසපටක්ඇති; තපසාසනස්ස, තපස්සීන්ට; නිකෙතභූතො, ගෘහ
වූ; සිස්සපසාධනස්ස, ශිෂ්‍යනැමැති ආභරණයාගෙ; සිරිධරො, ශො
භාදරන්නාවූ; (සොනාගසෙනම්පො යසරංසිපූරො ආසාවිසාලවල
යං ධවලිකරොති,) යනු හා සම්බන්ධයි.

23 ජම්බුද්දීපවරෙ නිරාපදකරෙ නිස්සෙස කොසාකරෙ
වෙලාවෙල්ලිත සාගරොරු ලහරී පාකාරගොපායිතෙ,
ධම්මාධිස්සර බොධිමඞ්ගලඝරෙ විජ්ජාපගා සාගරෙ
සාධුද්දර සරොරුහා කරවරෙ භූකාමිනීසෙඛරෙ.

නිරාපදකරෙ, විපත්තිදුරු කරන්නාවූ; නිස්සෙසකොස, සියලු
සම්පත්තියට; ආකරෙ, උත්පත්තිස්ථානවූ; වෙලාවෙල්ලිත, වෙරළව
ළඳිනාලද; සාගර, සමුද්‍රයාගේ; උරු, මහත්වූ; ලහරී, තරඞ්ගනැ
මැති; පාකාර, පවුරෙන්; ගොපායිතෙ, රක්ෂාකරණලද්දාවූ; ධම්මාධි
ස්සර, ධර්මේශ්වරයාගෙ; භෙවත් සර්වඥයන්වහන්සේගෙ; බොධි, ස
ම්‍යක්සම්බොධි සමධිගමයට; මඞ්ගලඝරෙ, මගුල්ගෙයක් වැනිවූ;
විජ්ජාපගාසාගරෙ, විද්‍යානැමැතිනදීන්ට සමුද්‍රයක්වැනිවූ; සාධු, සජ්ජ
නනැමැති; උද්දර, මහත්වූ; සරොරුහ, පද්මයන්ට; ආකරවරෙ, උ
ත්තමාකරවූ; භූකාමිනීසෙඛරෙ, මහීකාන්තාවට මුදුන්මල්කඩක්බඳු
වූ; ජම්බුද්දීපවරෙ, උත්තමජම්බුද්වීපයෙහි.

24 දෙසොරි මද්දන සමුන්නත නාමධෙය්‍යො
සම්පන්න කොසපරිවාර මහාකුලඩ්ඪො,
සබ්බූපභොග පරිපුණ්ණ ගහාභිරාමො
ධම්මාභිරාමජන විස්සමණස්සමොහු.

අරි, ශත්‍රූන්ගෙ; මද්දන, මැඩීමෙන්; සමුන්නත, ප්‍රාදුර්භූතවූ; නාමධෙය්‍යො, නම්ඇති; සම්පන්නකොස, සමෘද්ධවූවස්තුවහා; පරිවාර, පිරිසත්හා; මහාකුලඩ්ඪො, පූජ්‍යවූ වංශයෙන්යුක්තවූ; සබ්බූපභොග, සියලු අනුභවකටයුතු වස්තුවෙන්; පුණ්ණ, පිරුණාවූ; ගහාභිරාමො, ගෘහයෙන්සිත්කලුවූ; ධම්මාභිරාමජන, ධර්මයෙහිඇලුම්ඇති සත්වයන්ට; විස්සමණස්සමො; විශ්‍රාමයකරණ ආශ්‍රමයක්වැනිවූ; දෙසො, දෙශයෙක්; අහූ, වී.

(යත්ථගතා, යම් දෙශයකට ගියාවූ)

25 ජිනවරතනුයා ගුණභූ රුහභූ
පරහිතනිරතා සහිතාවහිතා,
සුචරිතචරිතො පසමාභරණා
සචරණසරසීරුහ මණ්ඩනතො.

ජිනවරතනුයා, උත්තමවූ සර්වඥපුත්‍රයෝ; ගුණභූරුහභූ, ගුණනැමැතිවෘක්‍ෂයන්ට භූමිහුද; පරහිතනිරතා, පරාර්ථයෙහි ඇලුනාහුද; සහිතාවහිතා, ආත්මාර්ථයෙහි පිහිටියාහුද; සුචරිතචරිත, නිර්මලවූ චාරිත්‍ර චාරිත්‍රද; උපසම, ශ්‍රමණගුණද; ආභරණා, රක්‍ෂාකෙරෙද්ද; හෙවත් ආභරණකොට ඇත්තාහුද; සචරණසරසීරුහ මණ්ඩනතො, ස්වකීයවූ පාදපද්මනැමැති අලඞ්කාරයෙන්,-

26 කමලාකරතං උපනෙන්තිහියං
සතතං සුඛිතා සුබුධා විබුධා,
අමරා විය නන්දනමජ්ඣගතා
මුදිතා භිරමන්තිහි යත්ථගතා.

හි, යම්හෙයකින්; යං, යමක්හු; කමලාකරතං, ශ්‍රීකාන්තාවටආකරබවට; හෙවත් සම්පත්තියටආකරබවට; උපනෙන්ති, පමුණුවන්නාහුද; සතතං, අනවරතයෙන්; සුඛිතා, සුවපත්වූවාහුද; සුබුධා, මනාවූදැනුම්ඇත්තාහුද; විබුධා, ප්‍රාඥයෝද; යත්ථගතා, යම්දෙශයකටගියාහු; නන්දනමජ්ඣගතා, නන්දනොද්‍යානමධ්‍යයට ගියාවූ; හෙවත් පැමිණියාවූ; අමරාවිය, දෙවතාවන්මෙන්; මුදිතා, සන්තුෂ්ටවූවාහු; අභිරමන්ති, විශෙෂයෙන්ඇලී වාසයකෙරෙද්ද.

27 දෙසෙ තස්මිං විමලකමලා දෙවි මූලාධිවාසෙ
පාරාවාරොපනීත විවිධොදාර මුත්තාදිසාරෙ,
අඩ්ඪෙ නානාජන ධනහරා භූමිභෙදාභිසඞ්ඛා
සම්පන්නඞ්ගා සුජනභරණා රාජධානී අහොසි.

විමල, නිර්මලවූ; කමලාදෙවි, ශ්‍රීකාන්තාවට; මූලාධිවාසෙ, වාසස්ථානවූ; පාරාවාර, සමුද්‍රයෙන්; උපනීත, පැමිණියාවූ; විවිධ, අනෙකප්‍රකාරවූ; උදාර, මහත්වූ; මුත්තාදිසාරෙ, මුක්තාමාණික්‍යාදිසාරවස්තු ඇති; අඩ්ඪෙ, ආඪ්‍යවූ; නානාජන, නොයෙක්ජනයන්හා; ධන, වස්තූන්ගේ; හරා, හාරයෙන්; භූමිභෙදාභිසඞ්ඛා, භූමිභෙදවෙයි යන ශඞ්කාවන්ඇති; තස්මිංදෙසෙ, ඒ ශත්‍රුමර්දනනම්වූදෙශයෙහි; හෙවත් අරිමර්දනනම්දෙශයෙහි; සම්පන්න, සමෘද්ධවූ; අඞ්ගා, (ස්වාම්‍යමාත්‍යසුහෘත්කොශ රාෂ්ට්‍ර දුර්ගබලානීච, ස්වාමිය, අමාත්‍යය, සුහෘද්‍ය, කොශය, රාෂ්ට්‍රය, දුර්ගය, බලය, යන) සප්තාඞ්ගයක්ඇති; සුජනභරණා, සාධූන්ගේ පොෂ්‍යඇති; රාජධානීඅහොසි. රාජධානියෙක්වී.

28 සාරොදග්ග විසාල සාලවලයො යස්සං සුධාමණ්ඩිතො
ලඞ්කාබිසඞ්ගම මඞ්ගලාවුතසිත ප්පාලම්බ පට්ටාවලී,
පිණ්ඩීභූය පදක්ඛිණාහිත තනු කිත්තිප්පබන්ධො යථා
භූපාලස්ස විරාජතෙ පතිදිසං ගන්ත්වා දිසොගුණ්ඨිතං.

යස්සං, යම්රාජධානියෙක්හි; සුධාමණ්ඩිතො, සුණුකර්මාන්තයෙන් සැරසුනාවූ; සාර, ස්ථිරවූ; උදග්ග, උඩඟුවූ; විසාල, පෘථුලවූ; සාලවලයො, ප්‍රාකාරමණ්ඩලය; විරාජතෙ, බබලන්නේයි; (කෙසේදයත්?) ලඞ්කාබිසඞ්ගමමඞ්ගලෙ, ශ්‍රීකාන්තාවගේ ප්‍රථම මඞ්ගල්‍යයෙහි; ආවුත, මනාකොට වටඅඳනාලද; හෙවත් වටසිසාරාමුවහකරණලද්දාවූ; සිත, ධවලවූ; පාලම්බ, අතිප්‍රලම්බවූ; හෙවත් ඌර්ධාධස්තල නොදක්කහැකිසේ මුවහකරණලද; පට්ටාවලී, පට්ශ්‍රෙණියක්වැනිවූ; හෙවත්; ස්වෙතපට්ටාන්තරයක් වැනිවූ; (තවද;) පතිදිසංගන්ත්වා, දිගක්පාසා ගොසින්; දිසොගුණ්ඨිතං, දික්වනිතාවන්විසින් වටපොරෝණාලදුව; පිණ්ඩිභූය, එක්ව; පදක්ඛිණ, පැදකුණුකොට; ආහිත, පිහිටුවනලද්දාවූ; තනු, මූර්තිඇති; භූපාලස්ස, රජහුගේ; කිත්තිප්පබන්ධොයථා, කීර්තිප්‍රබන්ධයමෙන්; විරාජතෙ, (ප්‍රාකාරමණ්ඩලයතෙම) බබලන්නේයි.

(යසසංච, සම්රාජධානියෙක්ති.)

29 පාසාදෙ හිමසෙලකූට ධවලො භූපාලමූලාලයො
කූටාගාරපරම්පරා චිතසිරො රඞ්ගප්පසඞ්ගාකුලො,
දෙවින්දස්ස විනින්දතිප්පතිදිනං පාලම්බහෙමාවලී
දෙවානන්දන නන්දනාභිරමණෙ එරාවණං වාරණං.

හිමසෙලකූට, හිමාලයපර්වතයසේ; ධවලො, ශුභ්‍රවූ; භූපාලමූලාලයො, රජහට මූලස්ථානවූ; කූටාගාරපරම්පරා, කූටාගාරපරම්පරාවන්ගේ; චිත, චෛත්‍යනැමැති; හෙවත් ස්තූපිනැමැති; සිරොරඞ්ගප්පසඞ්ගාකුලො, සිරොනෘත්‍යප්‍රාපතින් ගැවසිගත්තාවූ; පාලම්බහෙමාවලී, ප්‍රාලම්බවූ රන්දැල්ඇති; පාසාදෙ, ප්‍රාසාදයතෙම; දෙවින්දස්ස, ශක්‍රදෙවරාජයාගේ; දෙවානන්දන, දිව්‍යසමෘද්ධින්යුක්තවූ; නන්දනාභිරමණෙ, නන්දනොද්‍යාන ක්‍රීඩායෙහි; එරාවණංවාරණං, ඓරාවණනම්හස්තිරාජයාට; පතිදිනං, දවසක්පාසා; විනින්දති, නින්දකෙරෙයි.

30 තොරණෙසුච බද්ධකිඞ්කිණී
ජාල ජාතරණිතෙන හාරිණිං,
රඞ්ගකෙළි චතුරොච මාරුතො
ගායතෙව නගරී පතීයසං.

තොරණෙසුච, තොරණෙහිද; බද්ධ, බඳනාලද්දවූ; කිඞ්කිණීජාල, රසුදැලින්; ජාත, සඤ්ජාතවූ; රණිතෙන, නාදකරණකොටගෙණ; රඞ්ගකෙළි, නෘත්‍යක්‍රීඩායෙහි; චතුරොච, දක්ෂයකුමෙන්; මාරුතො, මාරුතයතෙම; හාරිණිං, මනොඥවූ; නගරීපතීයසං, පුරාධිශ්වරයාගේයශස්; ගායතෙව, ගායනාකෙරෙයියිතම්.

31 දානම්බු ධාරා පරිපාන පීණිතා
මත්තද්විපානං ඝනදානපඞ්කිලෙ,
ගණ්ඩත්ථලෙ බද්ධපදා සිලීමුඛා
නිබද්ධ ඣඞ්කාර රවෙන සූයරෙ.

දානම්බුධාරා, මදජලධාරාවන්; පරිපාන, අවපින්බීමෙන්; පීණිතා, පිණාගියාවූ; මත්තද්විපානං, මත්තහස්තීන්ගේ; ඝනදානපඞ්කිලෙ, බොහෝවූ මදජලනැමැති කර්දමඇති; ගණ්ඩත්ථලෙ, කපොලස්ථලයෙහි; බද්ධපදා, බැඳීගියපාදඇති; සිලීමුඛා, මධුකරයෝ; නිබද්ධ, නිබද්ධකරණලද; ඣඞ්කාරරවෙන, ඣඞ්කාරනාදයෙන්; සූයරෙ දන්නාලැබෙත්.

(යස්සං, යම් රාජධානියෙක්හි.)

32 තුරඞ්ගමා කිඞ්කිණීජාල බද්ධා
ජඞ්ඝාල වෙගෙන විජම්භමානා,
සද්දායමානා ච නභෙ චරානං
සහස්ස භානුස්ස තුරඞ්ගමානං.

කිඞ්කිණීජාලබද්ධා, රසුදැල්බඳනාලද; තුරඞ්ගමා, අශ්වයෝ; ජඞ්ඝාලවෙගෙන, පැනුම්වෙගයෙන්; විජම්භමානා, පැලඹෙන්නාහු; නභෙචරානං, ආකාශයෙහි සඤ්චාරණය කරන්නාවූ; සහස්සභානුස්ස, සහස්‍රරශ්මීහුගේ; හෙවත් සූර්‍ය්‍යයාගේ; තුරඞ්ගමානං, නිලාශ්වයන්ට; සද්දායමානාව, හඬගාන්නවුන්වැන්නාහුයි.

(යස්සඤ්ච, යම් රාජධානියෙක්හිද).

33 මධුකර නිකරානං පානගාරාරවින්ද
තටරුහ තරුසාඛා අඤ්ජලී පෙයතොයා,
විවිධ විහග කීළා ගායනා කෙළි රඞ්ගා
සිසිර මධුර නීරා පොක්ඛරඤ්ඤො රමෙන්ති.

මධුකරනිකරානං, මධුකරසමූහයන්ට; පානගාර, පානීයශාලාවක් වැනිවූ; අරවින්ද, පද්මයන්ඇති; තටරුහ, තීරයෙහි හටගත්තාවූ; තරුසාඛා, වෘක්ෂසාඛානැමැති; අඤ්ජලී, හස්තපුටයෙන්; හෙවත් දෙහොතින්; පෙයතොයා, පියහැකිජලඇති; විවිධවිහගකීළා, අනෙකප්‍රකාර පක්ෂීන්ගේ ක්‍රීඩාහා; ගායනාකෙළිරඞ්ගා, ගීතක්‍රීඩාවට රඞ්ගමණ්ඩලයක් වැනිවූ; සිසිර, සිහිල්වූ; මධුර, මිහිරිවූ; නීරා, ජලඇති; පොක්ඛරඤ්ඤො, පුෂ්කරණීහු; රමෙන්ති, සිත්අලවන්නාහුයි.

(යස්සඤ්ච, යම් රාජධානියෙක්හිම.)

34 කොකිලාලිකුල මඤ්ජුසිඤ්ජිතා
මඤ්ජරීජ රජපුඤ්ජ රඤ්ජිතා,
චාරුකාමරති දූතචූතකා
රඤ්ජයන්ති යුවිනොව කානනෙ.

කොකිල, කොවුලන්හා; අලිකුල, මධුකරසමූහයන්ගේ; මඤ්ජුසිඤ්ජිතා, මනොඥවූනාදඇති; මඤ්ජරීජ, කුසුමස්තබකයෙහිජාතවූ; රජපුඤ්ජරඤ්ජිතා, රජස්සමූහයෙන් රැඳුනාවූ; චාරු, සිත්කලුවූ; කාමරති, කාමරතියට; දූත, දූතයන්වැනිවූ; චූතකා, මීඅඹවෘක්ෂයෝ; කානනෙ, වනයෙහි; යුවිනොව, තරුණ පුරුෂයන්මෙන්; රඤ්ජයන්ති, සිත්අලවන්නාහුයි.

35 එවංවිධෙ විවිධරම්ම විභූතිසාරෙ
තථාර්මද්දනපුරෙ පරදුප්පසය්හෙ,
සාමන්තමොලි මණිරඤ්ජිත පාදපීඨො
ධම්මෙන සාසති භුවං සිරිධම්මරාජා.

එවංවිධෙ, මෙබඳුප්‍රකාරඇති; විවිධරම්ම, අනෙකප්‍රකාරයෙන් සිත්කලුවූ; විභූතිසාරෙ, සම්පත්තිසාරඇති; පරදුප්පසය්හෙ, ශත්‍රූන් විසින්මැඩගත නොහැක්කාවූ; තථාර්මද්දනපුරෙ, ඒ ශත්‍රුමර්දන නම්පුරයෙහි; හෙවත් අරිමද්දනදෙසයෙහි; සාමන්තමොලි, සාමන්ත රජදරුවන්ගේ කිරීටයෙහි; හෙවත් ඔටුන්නෙහි; මණිරඤ්ජිත පාද පීඨො, මාණික්‍යකාන්තියෙන් රැඳුනාවූ; හෙවත් මාණික්‍ය නැමැති අලත්තයෙන්රත්වූපාදතලඇති; සිරිධම්මරාජා, ධර්මාර්ථකාමයයි කිය නලද ත්‍රිවර්ගසම්පත්තීන්යුක්ත ධර්මරාජතෙම; භුවං, සකලපෘථිවිය; ධම්මෙන, දශරාජ ධර්මයෙන්; සාසති, අනුශාසනා කරන්නේයි.

**තවද, ශ්ලෝකයක්**

36 යෙනින්ද්‍රියානි සකලානි වසීකතානි
සම්පන්න ඤාණ කරුණාගුණ භාවනෙන,
ධම්මෙපි සො හිරමතෙ නිජමින්දිරෙව
මොළියථාවහති සඞ්ඝපදාරවින්දෙ.

යෙන, යම්කහුවිසින්; සම්පන්න, සම්පූර්ණවූ; ඤාණ, සමස්තවස්තු විෂයවූඥාණයන්ගේද; කරුණා, දුක්ඛාපගමවාඤ්ඡාලක්ෂණවූ කරුණාවගේද; ගුණ, මෛත්‍රීක්ෂමොප ශමාදි ගුණයන්ගේද; භාවනෙන, වැඩීමෙන්; ඉන්ද්‍රියානි, චක්ෂුරාදිවූ පඤ්චෙන්ද්‍රියය, ධර්මාදිවූ ෂඩායතනය පායූපස්ථාදිවූ ඉන්ද්‍රියපඤ්චකයයන; සකලානි, සියලුම ඒකාදශෙන්ද්‍රිය යෝ; වසීකතානි, වසඟකරණලද්දාහුද; * සඞ්ඝපදාරවින්දෙ, සඞ්ඝ

---

* ඔහු කවරහයත්?

මනොනෙත්‍ර ශ්‍රුතිඝ්‍රාණ ජිහ්වාකාය තදාශ්‍රයාඃ,
ධර්මෝරූපං ධ්වනිර්ගන්ධො රසඃ ස්පර්ශශ්ච ගොචරාඃ.
පායූපස්ථම්පාණි පාදෞ වචනඤ්චෙති පඤ්චකම්,
ස්වානන්දනාදාන ගමනා ලපනඤ්ච ව්‍රතක්‍රියා.
ඉත්ථමෙකාදශා ක්ෂණාඤ්ච සස්මෘතීනාං ව්‍යවස්ථිතම්,
යෛඃ සෛවශ්ච විජිතො රාජා ජිතෙන්ද්‍රිය ඉතිස්මෘතඃ
මේ ඒකාදශෙන්ද්‍රියයෝයි.

පාදනැමැති පද්මයන්; මොලීයථා, කිරීටයමෙන්; ආවහති, දරාද; සො, ඒත්‍රිවර්ගසම්පත්තීන්ද්‍රකාන්ත ධම්මරාජතෙම; ධම්මෙපි, ධර්මයෙහිද; නිජමන්දිරෙව, ස්වකීයවූ රාජභවනයෙහි මෙන්; අභිරමතෙ, විශෙෂ යෙන්අභිරමණය කරන්නේයි.

37 ඛග්ගයට්ඨි රණකෙළිදොහළා යස්ස පාණිසරසීරුහෙට්ඨිතා,
වෙරිවීරභට චිත්තකොටරා වුට්ඨිතාව ඝනධූම සන්තති.

යස්ස, යමක්හුගෙ; රණකෙළිදොහළා, යුධක්‍රීඩායෙහි කරණ ලද දෞහෘදයඇති; හෙවත් මහදෛලඇති; පාණිසරසීරුහෙට්ඨිතා, හ ස්තතල නැමැති පද්මයෙහි පිහිටියාවූ; ඛග්ගයට්ඨි, නිස්ත්‍රිංශපත්‍රය; හෙවත් ඛඩ්ගපත්‍රය; කෙබඳුදයත්? වෙරිවීරභට, ශත්‍රුවීරභටයන්ගෙ; චිත්තකොටරා, හෘදයනැමැති කොටරයෙන්; වුට්ඨිතා, නැංගාවූ; ඝන, සාන්ද්‍රවූ; හෙවත් එක්වගියාවූ; ධූමසන්තතිඉව, ධූමරාශියක්වැන්නේයි.

(යසසබලු; යමක්හුගේ වනාහි.)

38 කිං චිත්තං යදිසින්ධුවාරිජඨරෙ ධාවං භුජඞ්ගාලයං
සම්බාධාරිභටාටවී න සම්භො දුබ්බාර තෙජොනලො,
චිත්තං නත්තපලයුගග දීධිතිමහා මත්තණ්ඩචණ්ඩත්තනා
යනෙත්තනාරි විලාසිනී ජලනිධිං නාසෙති නිස්සෙසතො.

යදි; ඉදින්; සම්බාධා, මොහවට බඳනාලද; අරිභට, සතුරුයොධ යන්නැමැති; අටවී, වනයෙන් ඇත්තාවූ; දුබ්බාර, වැළකිය නොහැක් කාවූ; තෙජොනලො, තෙජස් නැමැති වහ්නියතෙම; භුජඞ්ගාලයං, නාගභවනයට; හෙවත් රසාතලයට; සින්ධුවාරිජඨරෙ, සමුද්‍රකුක්ෂි යෙහි; ධාවං, දිවෙමින්; නසම්භො, නොසන්හුන්ය යන; යං, යමෙ ක්ඇද්ද; හෙවත් නොනිවීමෙක් ඇද්ද; තං, ඒතෙම; කිංචිත්තං, කව රආශ්චය්‍යීයෙක්ද? පලය, කල්පක්ෂය කාලයෙහි; උග්ගදීධිති, උග්‍රවූ රශ්මිඇති; මහා, මහත්වූ; මත්තණ්ඩ, සූය්‍යීයාමෙන්; චණ්ඩත්තනා, ච ණ්ඩස්වභාවඇති; තෙන, ඒතපොවහනියෙන්; අරිවිලාසිනීජලනිධිං, ශත්‍රුකාන්තාවන් නැමැති සමුද්‍රය; නිස්සෙසතො, නිරවශෙෂයෙන්; නාසෙති, නැසීයන; යං, යමෙක්ඇද්ද; හෙවත් නොනැසීදිවීමෙක් ඇද්ද; තං, ඒ තෙම; චිත්තං, ආශ්චය්‍යීයි.

39 යසප්පබන්ධා සරදබ්භසුබ්භා
දිසාදසා භිප්පසරන්ති යස්ස,
කවීන වාචායනවාත වෙගා
පිචුප්පබන්ධා විය විප්පකිණ්ණා.

යස්ස, යම්රජක්හුගේ; සරදබ්භසුබ්භා, ශරත්කාලයෙහි මේඝ පටලයක්මෙන් සුදුවූ; යසප්පබන්ධා, කීර්ත්තිරාශීහු; කවීනං, කවීන්ගේ; වාචා, ස්තුතිවචන නැමැති; ආයනවාත, හමනවාතයන්ගේ; වෙගා, වෙගයෙන්; දසදිසා, දශදිශාවමුලුල්ලෙහි; විප්පකිණ්ණාපිචුප්පබන්ධා විය, විසුරුවනලද තූලරාශීන්මෙන්; අභිප්පසරන්ති, පැතිරේද්ද.

40 රාජින්දිරා මඞ්ගලදප්පණෙන
තිවග්ගලක්ඛී රතිමන්දිරෙන,
නරාධිරාජෙන මනොභිරාමො
කතොච ආරාමවරො උළාරො.

රාජින්දිරා, රාජලක්ෂ්මියගෙ; මඞ්ගලදප්පණෙන, මගුල්කැඩප තක් බඳුවූ; තිවග්ගලක්ඛී රතිමන්දිරෙන, ධර්මාර්ථකාම යන ත්‍රිවර්ග ශ්‍රී යගෙ අභිරමණයට ගෙයක්බඳුවූ; නරාධිරාජෙන, ඒනරෙශ්වරයා වි සින්; මනොභිරාමො, සිත්කලුවූ; උළාරො, උතුම්වූ; ආරාමවරොච, අ රාමශ්‍රෙෂ්ඨයතෙම; කතො, කෙළේයි.

(යත්‍රච, යම් විහාර යෙක්හි වනාහි)

41 පාකාරමණ්ඩල පරික්ඛිත ගෙහපාලී
රම්මා සුධාවිලසිතා වලිතාජුතීහි,
ඛීරම්බුරාසි පරිවත්තන වෙගජාත
ඵෙණාවලීව නිබිඩා ලහරී විතඩා.

රම්මා, සිත්කලුවූ; සුධාවිලසිතා, සුණුකර්මාන්තයෙන් සැදුම්කර ණලද; ජුතීහි, ශොභාවෙන්; වලිතා, වසනලද්දවූ; පාකාරමණ්ඩල, ප්‍රාකාරපරික්ෂෙපයෙන්; පරික්ඛිත, වටකරණලද; ගෙහපාලී, ප්‍රාසාද පෙළ; නිබිඩා, සාන්ද්‍රවූ; ලහරීවිතඩා, රළින් ගැවසීගත්තාවූ; ඛීරම්බු රාසි, ක්ෂීරසාගරයාගෙ; පරිවත්තනවෙගා, අලලනා වේගයෙන්; ජාත, උපන්නාවූ; ඵෙණාවලීව, පෙණපෙළක්බඳු විද.

42 යොගානුයොගාදි ගුණොදිතෙන
විකම්පිතා සංයමිනං ගණෙන,
උබ්බන්ධිතා පාපභටාව යත්ථ
ධජාචමච්චුන්නත තොරණෙසු.

යත්ථ, යම් විහාරයෙක්හි; යොගානුයොගාදි, සමථවිදර්ශනාදිවූ භාවනා යොගයෙහි අනවරතයෙන් යෙදීමආදිකොට ඇති; ගුණොදිතෙන, ගුණයෙන්උස්වූ; සංයමිනංගණෙන, භික්ෂුන්ගෙසමූහයෙන්; විකම්පිතා, සලනලදුව; උබ්බන්ධිතා, උඩබඳිනා ලද්දාවූ; පාපභටාව, පාපයොධයන්මෙන්; අච්චුන්නතතොරණෙසු, ඉතා උස්වූ; තොරණ් වල්හි; ධජාච, ධ්වජයෝ (බබලද්ද).

(යස්මිං, යම් විහාරයක් සමීපයෙහි.)

43 පභාතකාලෙ හිමබින්දු සන්දති
විහඞ්ගමො දීරිත නාදනාදිතා,
තපොධනානං තපතෙජතජ්ජිතා
රුදන්තිමඤ්ඤෙ පවනා වනාලයො.

පවනා, හමන්නාවූ පවන්ඇති; වනාලයො, වනපන්තීහු; පභාතකාලෙ, ප්‍රභාතකාලයෙහි; හිමබින්දුසන්දති, හිමබින්දු වැහෙන්නාවූ; විහඞ්ගමොදීරිත නාදනාදිතා, පක්ෂීන්විසින් නගනලද හඬින්හටගත්තාවූ හඬඇති; තපොධනානං, තපස්වි වරයන්ගෙ; තපතෙජතජ්ජිතා, තපතෙජසින් තැතිගත්තාහු; රුදන්තිමඤ්ඤෙ, හඬතිගෙහිම්

(යත්ථච, යම්විහාරයෙක්හි වනාහි.)

44 කමලිනි මලිනීලසරොරුහා සරසා සරසා රසමණ්ඩනා,
අවිරසාවිරසා පතාපහා තපවනො පවනො දරහාරිණී.

අලිනීලසරොරුහා, භෘඞ්ගයන් සහිතවූ නීලොත්පල ඇති; නොහොත් භෘඞ්ගයන්විසින් නිල්වූ පදුමඇති; සරසා, නාදසහිතවූ; නොහොත් මධුර නාදසහිතවූ; සරසාරස මණ්ඩනා, විල්ලිහිණියන්හා පද්මයන්ගේ සැරසිම්ඇත්තාවූ; අවිරස, පහවූ රස නැත්තාවූ; හෙවත්පහනුවූරසඇත්තාවූ; විරසාපතාපහා, නොමිහිරිවූසන්තාපන සන්නාවූ; තපවනොපවනොදරහාරිණී,විහාරොපවනයාගේ කුක්ෂිය සිත්කලූකරන්නාවූ; කමලිනී, තටාකඇඈ; හෙවත් බබලද්ද.

45 තස්මිංවිහාරෙ විහරං යසස්සී
තපොනිකෙතො ගුණසන්නිවාසො,
සො සඞ්ඝරක්ඛිත ඉතීරිත නාමධෙය්‍යො
ථෙරො මහා සකලලොක කිරීටපාදො.

තස්මිංවිහාරෙ, ඒ විහාරයෙහි; විහරං, වසන්නාවූ; යසස්සී, යස පිරිවරඇත්තාවූ; තපොනිකෙතො, තපසටගෙයක්බඳුවූ; ගුණසන්නි වාසො, ගුණයන්ට වාසස්ථානවූ; සකලලොකකිරීටපාදො, සියලු ලෝ වැසියන්ට ඔටුන්නක්බඳුවූ පාදයන්ඇති; සඞ්ඝරක්ඛිතඉති, සඞ්ඝර ක්ඛිතයයි; ඊරිත, කියනලද; නාමධෙය්‍යො, නම්ඇති; සොමහාථෙ රො, ඒ මහාස්ථවිරයෙක්; වී.

(යසසබලු, යමක්හුගෙ වනාහි)

46 කුන්දාවදාතා කවිකණ්ඨහාරා
දිසම්බරාඩම්බර විප්පකිණ්ණා,
යසප්පබන්ධා සනරාමරොපි
තෙගාසිලොකො කතකණ්ණපූරො.

කුන්දාවදාතා, කොඳමලක්මෙන්සුදුවූ; කවිකණ්ඨහාරා, කවීන්ගෙ කණ්ඨයට මුක්තාහාරයක්බඳුවූ; යසප්පබන්ධා, යශස්රාසීනු; දිසම්බරා ඩම්බරවිප්පකිණ්ණා, දිශාඞ්ගනාවගෙ රඞ්ගවස්ත්‍රයක්මෙන් සාටො පව විසුරුවනලද්දාහුද; කතකණ්ණපූරො, කරණලද කර්ණාභරණ ඇති; සනරාමරොපිලොකො, මනුෂ්‍යයන්හා දෙවියන්සහිතවූ ලෝ වැසිතෙම; තෙ, ඒ යශස්ප්‍රබන්ධයන්; ගාසි, ගායනාකෙළේද.

47 යදිප්පවාලම්බුධි ඛීරසාගරා
සමංචරෙය්‍යුං භුවනෙ සමන්තතො,
තතොනුකුබ්බන්ති දිසාසුවිත්ථටා
යසප්පබන්ධා තපතෙජවෙල්ලිතා.

යදි, ඉදින්; පවාලම්බුධිඛීරසාගරා, ප්‍රවාලසමුද්‍රක්ෂීරසාගරයෝ; භුවනෙ, භුවනයෙහි; සමන්තතො, හාත්පසින්; සමංචරෙය්‍යුං, එක්ව හැසිරෙන්නාහුනම්; තතො, ඔහුකෙරෙන්; දිසාසුවිත්ථටා, දිශාවන් කෙරෙහි පතළාවූ; තපතෙජවෙල්ලිතා, තපතෙජසින්වසනලද්දාවූ; යසප්පබන්ධා, යශස්රාශීනු; අනුකුබ්බන්ති, අනුවක්‍රියාකෙරෙත්; හෙ වත් සරිවෙත්.

42 යොගානුයොගාදි ගුණොදිතෙන
විකම්පිතා සංයමිනං ගණෙන,
උබ්බන්ධිතා පාපභටාව යත්‍ථ
ධජාචමච්චුන්නත තොරණෙසු.

යත්‍ථ, යම් විහාරයෙක්හි; යොගානුයොගාදි, සමථවිදර්ශනාදිවූ භාවනා යොගයෙහි අනවරතයෙන් යෙදීමආදිකොට ඇති; ගුණොදිතෙන, ගුණයෙන් උස්වූ; සංයමිනංගණෙන, භික්ෂූන්ගෙසමූහයෙන්; විකම්පිතා, සලනලදුව; උබ්බන්ධිතා, උඩබඳියා ලද්දාවූ; පාපභටාව, පාපයොධයන්මෙන්; අච්චුන්නතතොරණෙසු, ඉතා උස්වූ; තොරණ වල්හි; ධජාච, ධව්ජයෝ (බබලද්ද).

(යස්මිං, යම් විහාරයක් සමීපයෙහි.)

43 පභාතකාලෙ හිමබින්දු සන්දති
විහඞ්ගමො දීරිත නාදනාදිතා,
තපොධනානං තපතෙජතජ්ජිතා
රුදන්තිමඤ්ඤෙ පවනා වනාලයො.

පවනා, හමන්නාවූ පවන්ඇති; වනාලයො, වනපන්තීහු; පභා තකාලෙ, ප්‍රභාතකාලයෙහි; හිමබින්දුසන්දති, හිමබිඳු වැහෙන්නාවූ; විහඞ්ගමොදීරිත නාදනාදිතා, පක්ෂීන්විසින් නගනලද හඬින්හටග ත්තාවූ හඬඇති; තපොධනානං, තපස්වි වරයන්ගෙ; තපතෙජත ජ්ජිතා, තපතෙජසින් තැතිගත්තාහු; රුදන්තිමඤ්ඤෙ, හඬතිහැඟිම්

(යත්‍ථච, යම්විහාරයෙක්හි වනාහි.)

44 කමලිනී මලිනීලසරොරුහා සරසා සරසා රසමණ්ඩනා,
අවිරසාවිරසා පතාපහා තපවනො පවනො දරහාරිණී.

අලිනීලසරොරුහා, භෘඞ්ගයන් සහිතවූ නීලොත්පල ඇති; නොහොත් භෘඞ්ගයන්විසින් නිල්වූ පදුමඇති; සරසා, නාදසහිතවූ; නොහොත් මධුර නාදසහිතවූ; සරසාරස මණ්ඩනා, විල්ලිහිණිය න්හා පද්මයන්ගේ සැරසීම්ඇත්තාවූ; අවිරස, පහවූ රස නැත්තාවූ; හෙවත්පහනුවූරසඇත්තාවූ; විරසාපතාපහා, නොමිහිරිවූසන්තාපන සන්නාවූ; තපවනොපවනොදරහාරිණී,විහාරොපවනයාගේ කුක්ෂිය සිත්කලූකරන්නාවූ; කමලිනී, තටාකඇඳූ; හෙවත් බබලද්ද.

45 තස්මිංවිහාරෙ විහරං යසස්සී
තපොනිකෙතො ගුණසන්නිවාසො,
සො සඞ්ඛරක්ඛිත ඉතීරිත නාමධෙය්‍යො
ථෙරො මහා සකලලොක කිරීටපාදෙ.

තස්මිංවිහාරෙ, ඒ විහාරයෙහි; විහරං, වසන්නාවූ; යසස්සී, යස පිරිවරඇත්තාවූ; තපොනිකෙතො, තපසට ගෙයක්බඳුවූ; ගුණසන්නි වාසො, ගුණයන්ට වාසස්ථානවූ; සකලලොකකිරීටපාදෙ, සියලු ලෝ වැසියන්ට ඔටුන්නක්බඳුවූ පාදයන්ඇති; සඞ්ඛරක්ඛිතඉති, සඞ්ඝර ක්ඛිතයයි; ඊරිත, කියනලද; නාමධෙය්‍යො, නම්ඇති; සොමහාථෙ රො, ඒ මහාස්ථවිරයෙක්; වී.

(යසසබලු, යමක්හුගෙ වනාහි)

46 කුන්දාවදාතා කවිකණ්ඨහාරා
දිසම්බරාඩම්බර විප්පකිණ්ණා,
යසප්පබන්ධා සනරාමරොපි
තෙගාසිලොකො කතකණ්ණපූරො.

කුන්දාවදාතා, කොඳමලක්මෙන්සුදුවූ; කවිකණ්ඨහාරා, කවීන්ගෙ කණ්ඨයට මුක්තාහාරයක්බඳුවූ; යසප්පබන්ධා, යශස්රාසීනු; දිසම්බරා ඩම්බරවිප්පකිණ්ණා, දිශාඞ්ගනාවගෙ රඞ්ගවස්ත්‍රයක්මෙන් සාටො පව විසුරුවනලද්දාහුද; කතකණ්ණපූරො, කරණලද කර්ණාභරණ ඇති; සනරාමරොපිලොකො, මනුෂ්‍යයන්හා දෙවියන්සහිතවූ ලෝ වැසිතෙම; තෙ, ඒ යශස්ප්‍රබන්ධයන්; ගාසි, ගායනාකෙළේද.

47 යදිප්පවාලම්බුධි ඛීරසාගරා
සමංචරෙය්‍යුං භුවනෙ සමන්තතො,
තතොනුකුබ්බන්ති දිසාසුවිත්ථටා
යසප්පබන්ධා තපතෙජවෙල්ලිතා.

යදි, ඉදින්; පවාලම්බුධිඛීරසාගරා, ප්‍රවාලසමුද්‍රක්ෂීරසාගරයෝ; භුවනෙ, භුවනයෙහි; සමන්තතො, හාත්පසින්; සමංචරෙය්‍යුං, එක්ව හැසිරෙන්නාහුනම්; තතො, ඔහුකෙරෙන්; දිසාසුවිත්ථටා, දිශාවන් කෙරෙහි පතළාවූ; තපතෙජවෙල්ලිතා, තපතෙජසින්වසනලද්දාවූ; යසප්පබන්ධා, යශස්රාශීනු; අනුකුබ්බන්ති, අනුවත්ක්‍රියාකෙරෙත්; හෙ වත් සරිවෙත්.

(යසසබලු, යමක්හුගෙ වනාහි.)

48 පවාල ගඞ්ගාභි විලොහිතච්ඡවි
විරාජතෙ පප්ඵුට තෙජ සන්තති,
පකාසිතුං කුඞ්කුම පඞ්ක ලෙපනං
දිසඞ්ගනා පීණ පයොධරො පරි.

පවාලගඞ්ගාභි, පබලුපිරුණු ගඞ්ගාවලින්; විලොහිතච්ඡවී, පොළඹාගන්නාලද ශොභාඇත්තාවූ; පප්ඵුට, පතළාවූ; තෙජසන්තතී, තෙජස් පරම්පරාතොමෝ; දිසඞ්ගනා, දික්නැමැති කාන්තාවගේ; පීණ, පිරුණාවූ; පයොධරො පරි, තනයන්ගෙ මතුයෙහි; කුඞ්කුම පඞ්කලෙපනං, කොකුම් මඩ ගැල්වීම; පකාසිතුං, ප්‍රකාශකරණු පිණිස; විරාජතෙ, බබලාද.

(තසසබලු, උන්වහන්සේගෙ වනාහි.)

49 ගුණාන මනෙතා ච නදිස්සතෙ මෙ
සරස්සතී සිදති මන්‍ද භාගා,
න මඤ්ජරී භාර පලම්බ සාඛෙ
ව සො ත්‍ථි පඞ්ගුස්ස හි සාලරාජෙ.

මෙ, මාවිසින්; ගුණානං, මෛත්‍රී ක්‍ෂමොප ශමාදී ගුණයන්ගේ; අනෙතා, කෙළවරක්; න දිස්සතෙ, නොදක්නාලැබෙයි; මන්‍දභාගා, කාලකන්නීවූ; සරස්සතී, සරස්වතීතොමෝ; සිදති, පසුබස්නියි; මඤ්ජරීභාර, කුසුමස්තබකයෙන්; පලම්බසාඛෙ, එල්ලෙන්නාවූඅතු ඇති; සාලරාජෙ, ශාලද්‍රැමරාජයා කෙරෙහි; පඞ්ගුස්ස, පිළි එකක් හුගේ; වසො, ප්‍රභුත්වයක්; නහිඅත්‍ථි, නැත්මැයි.

50 තං කස්සප මහාථෙරං බ්‍රවී ති ගුණසෙඛරො,
නාගසෙනමහාථෙරො ආසිංසන පුරස්සරං.

ගුණසෙඛරො, ගුණයන්ම මුදුන්මල්කඩකොටඇති; නාගසෙන මහාථෙරො, නාගසෙනනම් මහාස්ථවිරතෙම; ආසිංසන පුරස්සරං, ආසිංසන පෙරදැරිකොට හෙවත් ආශිර්වාද පෙරදැරිකොට; තං කස්සපමහාථෙරං, ඒ කාශ්‍යපමහාස්ථවිරයාහට; බ්‍රවී ති, කියන්නේයි.

51 දුබ්බාරා නඞ්ගවාතාහත තරලතරා ගාඪරාගුඪනීරා
හාරාධාරාභිරාමා මණිකිණිවලයා වෙලදිබ්බාසුපාලි,
විජ්ජුච්ඡායාසනාථා සනඛරකරකා මාරරාමාම්බුධාලි
නාලං යං චිත්තකෙකිම්පචලිතුකරණෙ පාතු තුම්හං සධීරො

දුබ්බාරා, වැළකියනොහැකි; අනඞ්ගවාතාහත, සඳසීනැමැති මාරුතයෙන් පහරණලදීන්; තරලතරා, අතිචඤ්චලවූ; ගාඪරා ගුඪනීරා, දෘඪරාගනැමැති දරණලද ජලඇති; හාර, මුක්තාහාරනැමැති; ධාරා, ජලධාරාවෙන්; අභිරාමා, සිත්කළුවූ; මණිකිණි, මාණික්‍යරශ්මීන්යුක්තවූ; වලය, වලලුහා; ආවෙල, රැලිනැමැති; දිබ්බාසුපාලි, ඉන්ද්‍රචාප සමූහඇති; විජ්ජුච්ඡායා; විදුලියශොභාවිටබඳුවූ; සනාථා, ශරීරසම්පත්ඇති; නොහොත් ශරීරයෙන් සමාරූඪිතවූ; සනඛරකරකා; සබකීයවූ නඛනැමැති පොදඇති; මාරරාමාම්බුධාලී, මාරසත්‍රිනැමැති මෙඝමාලාතොමෝ; යං චිත්ත කෙකිං, යම්සර්වඥකොතොකුන්වහන්සේගෙ චිත්තනැමැති මයූරයා; පචලිතුකරණෙ, චලනයකිරීමෙහි; න අලං, සමර්ථනොවීද; සො ධීරො, ඒ ප්‍රාඥතෙම; තුම්හං, තොපහැම්දෙනම, පාතු, රක්‍ෂාකෙරේවා.

52 යො යසො මනතී සෙකෙන නිබ්බාපෙති ජගත්තයං,
ධම්මරංසාභිසෙකෙන අභිසඤ්චෙති මානවං.

යො, යමෙක්තෙම; යසොමනතී; යශස්නැමැති මන්ත්‍රියාගෙ; සෙකෙන, ජලාභිෂෙකයෙන්; ජගත්තයං, තුන්ලොව; නිබ්බාපෙති, නිවාද; මානවං, මනුෂ්‍යලොකය; ධම්මරංසාභි සෙකෙන, ධර්මරශ්මින්ගෙ අභිෂෙකයෙන්; අභිසඤ්චෙති, තෙමාද.

53 වසනතියස්මිං කරුණාදයොගුණා
සිරීනිකෙතෙ විය රාජමන්දිරෙ,
අසඞ්ගචාරීතු යසො පරම්පරා
චරන්තිලොකෙ කුපියං ච පිණ්ඩිතා.

සිරීනිකෙතෙ, ශ්‍රීකාන්තාවට වාසස්ථානවූ; රාජමන්දිරෙවිය; රාජභවනයෙක්හි මෙන්; යස්මිං, යමක්හුකෙරෙහි; කරුණාදයොගුණා, කරුණාදිවූ ගුණයෝ; වසන්ති, වෙසෙද්ද; අසඞ්ගචාරීතුයසොපරම්පරා, නිඃසඞ්ගචාරිවූ යශස්සමූහයෝ වනාහි; පිණ්ඩිතා; එක්වූවාහු; ලොකෙ, ලොකයෙහි; කුපියං ඉව, කිළිපොලකමෙන්; චරන්ති, හැසිරෙන්නාහුද.

54 ලසති තුහිනරංසි පුණ්ණරංසි නිසායං
ලසති දිවසභාගෙ භානුමානන්තභානු,
හසති කමලසණ්ඩං පත්තාගිමහානකාලෙ
ජයති යතිවරොයං සබ්බදා මෙරුධීරො.

පුණ්ණරංසි, පුණ්ණවූ රශ්මිඇති; තුහිනරංසි, තුෂාර රශ්මිතෙම; නිසායං, රාත්‍රියෙහි; ලසති, බබලන්නේය; අනන්තභානු, අනන්ත රශ්මිඇති; භානුමා, සහස්‍රරශ්මිතෙම; දිවසභාගෙ; දිවාභාගයෙහි; ලසති, බබලන්නේය; පත්තාගිමහානකාලෙ, සම්ප්‍රාප්ත ඝර්මකාලයෙහි; කමලසණ්ඩං, පද්මසමූහය; හසති, ප්‍රබොධවන්නේය; මෙරුධීරො, මෙරුපර්වතයසේ නිශ්චලවූ ධෛර්‍ය්‍ය ඇති; අයංයතිවරො මේ යතීශ්වරතෙම; සබ්බදා, හැමකල්හි; ජයති, ජයගන්නේයි.

55 නිච්චං සිරිරමණමඞ්ගල මන්දිරෙන
පීණාමිතෙ චරණපල්ලවසෙඛරෙන
දිත්තප්පභාපටල පල්ලවිතොදරෙන
දෙවාසුරොරග සිරොමණිභස්සරෙන

නිච්චං, අනවරතයෙන්; සිරිරමණමඞ්ගලමන්දිරෙන, ශ්‍රීකාන්තාවගේ මනොඥවූ මගුල්ගෙයක්වැනිවූ; දිත්තප්පභාපටල, දිලිහුනාවූ ප්‍රභාපටලයෙන්; පල්ලවිතොදරෙන, සඤ්ජාතකිසලයට බඳුවූ පාදෙදරඇති; දෙවාසුරොරග, දිව්‍යඅසුරනාගයනමොවුන්ගේ; සිරොමණිභස්සරෙන, ශිරොමාණික්‍යයෙන් බබලනසුලුවූ; තෙ, නුඹවහන්සේගෙ; චරණපල්ලවසෙඛරෙන, පාදතල නැමැති මුදුන්මල් කඩින්; නිච්චං, සතතයෙන්; පීණාමි, පිණමි.

56 භදන්තපාදප්පහිතං හි පණ්ණ
මානීයදත්තං ගුණරුක්ඛපණ්ණං,
සද්ධාභිධානෙන පධානිනා යං
සමග්ග සාමග්ගිරසො ච තං මෙ.

හි, යම්හෙයකින්; භදන්තපාදප්පහිතං, භදන්තපාදයන්විසින් එවනලදුවූ; ගුණරුක්ඛපණ්ණං, ගුණනැමැතිවෘක්ෂයන්ගේ පර්ණයක්වැනිවූ; සද්ධාභිධානෙන, සද්ධාඛ්‍යාදීවූ; පධානිනා, ප්‍රධානීහුවිසින් ආනීය, ගෙනහැර; දත්තං, දෙනලද්දවූ; යංපණ්ණං, යම්පර්ණයක් ඇද්ද; මෙ, මට; තං, ඒපර්ණය; සමග්ගසාමග්ගිරසොච, සියලුසාමග්‍රිරසය මැයි.

57 දීඝානපණ්ණං තවගුර්වණ්ණං
සුත්වාන සන්දෙස මුළාරපීති,
ජාතොම්හි සම්මානන භාජනාන
මායාචනා පීති වසීකරොති.


තව, තුබවහන්සේගේ; සන්දෙසපණ්ණං, සන්දෙශපත්‍රය; දීඝාන දූත; ගුර්වණ්ණං, බොහෝගුණ; සුත්වාන, අසා; (සොඅහං හෙමම) උළාරපීති, මහත්ප්‍රීතිඇත්තෙක්; ජාතොම්හි, වූයෙමි; හෙවත් ප්‍රීතිය ටපැමිණියේවෙමි; සම්මාන නභාජනානං, සත්කාරයට භාජනයන් ගේ; ආයාචනා, ආරාධනාතොමෝ; පීති, ප්‍රීතිය; වසිකරොති, අයිති කරන්නේයි.

58 පවාරණා භාතියදත්පිකෙන
යෙනත්පි අනෙනා පහිණනතිපණ්ණං,
සමාදයිස්සාම යථාබලං තං
පීරාය සාමග්ගින භෙදනීයා.

59 සාරිපුත්තස්ස පුච්ඡාම කුසලං කුසලෙසිනො,
පුඤ්ඤඤ්ච පරිනයිස්සාම සාසනට්ඨිතිකාමිනො.

නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු